## සංක්ෂිප්තය

උපාධිධාරී ගුරුවරුන් ගුරු වෘත්තිය පිළිබඳ දක්වන සංජානනය පිළිබඳව සොයා බැලීම මෙම අධ්‍යයනය තුළින් සිදු කෙරේ. උපාධිධාරී ගුරුවරුන් ගුරු වෘත්තිය තෝරාගැනීමට හේතු අනාවරණය කරගැනීම, උපාධාධාරී ගුරුවරුන් ගුරු වෘත්තිය පිළිබඳව දක්වන සංජානනවල ස්වභාවය හඳුනාගැනීම, (ස්ත්‍රී පුරුෂ භාවය, වයස, සේවා කාලය අනුව) උපාධිධාරී ගුරුවරුන්ගේ අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, ඉගැන්වීම, පාසල් පරිපාලනයට දක්වන සහාය හා ගුරු පෞරුෂය සම්බන්ධයෙන් ඇති සංජානනය පිළිබඳ සොයා බැලීම සහ ගුරු වෘත්තිය සඳහා ධනාත්මක සංජානනයක් ඇති කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම යන අරමුණු මත අධ්‍යයනය සිදුවිය.

සමීක්ෂණ පර්යේෂණ ක්‍රමයට අනුව කරනු ලැබූ මෙම අධ්‍යයනයේ සුවිශේෂී නියැදිය වශයෙන් යොදා ගන්නා ලද්දේ කෑගල්ල අධ්‍යාපන කලාපයේ වරකාපොල අධ්‍යාපන කොට්ඨාසයේ උපාධිධාරී ගුරුවරුන් 100 ක් ය. දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි සහ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා යොදා ගනු ලැබීය. ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණ ක්‍රම දෙක ම යොදා ගෙන දත්ත විශ්ලේෂණය හා අර්ථකථනය සිදු කරනු ලැබීය. ලබා ගත් දත්ත ගුණාත්මකව මෙන්ම ප්‍රමාණාත්මකව ප්‍රතිශත, වගු, ප්‍රස්තාර ඇසුරින් අරමුණු වලට අදාළව විශ්ලේෂණය කර ඉදිරිපත් කරන ලදී. දැනුම දරුවන්ට ලබාදීම, නිසි මඟපෙන්වීම් කළ හැකි වීම, සහ ඉතා වටිනා සේවාවක් වීම, යනාදිය උපාධිධාරී ගුරුවරුන්ට ගුරු වෘත්තිය තෝරා ගැනීමට හේතුවී ඇති බව අනාවරණය විය. ඉගැන්වීම සම්බන්ධව 100% ක ඉතා ඉහළ ධනාත්මක සංජානනයක් පවතින බවත් ස්ත්‍රී පුරුෂ සියලුම උපාධිධාරී ගුරුවරුන් වයස් භේදයකින් තොරව පාසල් පරිපාලන කටයුතුවලට සහාය දැක්වීමට අකමැත්තක් දැක්වීමත්, උපාධිධාරී ගුරුවරියන්ට වඩා පිරිමි ගුරුවරුන් පාසල් පරිපාලනයට සහාය දැක්වීමට වැඩි කැමැත්තක් ඇති බව වැඩි දුරටත් මෙහිදී අනාවරණය විය.

උපාධිධාරී ගුරුවරුන්ගේ වැටුප් වැඩි කිරීම, උසස්වීම් විධිමත්ව සිදුකිරීම, ගුරු වෘත්තිය සම්බන්ධයෙන් අදාළවන්නා වූ චක්‍ර ලේඛ යාවත් කාලීන කිරීම, ගුරු වෘත්තිය කරගෙන යාම සඳහා විදුහල්පතිවරුන්ගේ සහාය ලැබීම, ගුරුවරුන් පාසල තුළ ඇගයීම සඳහා විධිමත් ඇගයීම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම යනාදී යෝජනා ක්‍රියාවලියට නැංවීමෙන් උපාධිධාරී ගුරුවරුන් තුළ ගුරු වෘත්තිය පිළිබඳ ධනාත්මක සංජානනයක් ඇති කළ හැකි බවට අධ්‍යයනයෙන් යෝජනා කළ හැකි විය.